# බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ**
**සිවිල් III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය)**
**සඳහා බඳවා ගැනීම (විවෘත) - 2019**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) ( දෙවසරක පුහුණු කාලය)

01. 1.1. **පොදු සුදුසුකම් -**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය .
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය .
III. යම් ආගමක නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක්(3) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
VI. වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය.
VII. අයදුම්කරු බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**02. සේවා කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය.අනුමත සේවා ව්‍යවස්ථාව / රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසි වලට යටත් වේ.

03. **බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් පමණක් පවත්වනු ලැබේ. විභාගය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.
සමත් වීම සඳහා එක් ප්‍රශ්ණ පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවනවිට ,ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාල සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.

**04. සිවිල් III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගය**

| **විෂයන්** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| තාක්ෂණික හැකියාව | පැය 03 | 100 | 40% |

**05. තාක්ෂණ සේවයේ (සිවිල්) III තනතුරට බඳවා ගැනීමට අදාල අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

**අධ්‍යාපන සුදුසුකම්**

විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය,තාක්ෂණවේදය සඳහා විද්‍යාව,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම. සහ
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) සමත්වී තිබිම.

**වෘත්තීය සුදුසුකම්**

1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික(සිවිල්) ඩිප්ලෝමාව

හෝ

2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

3.අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උස ස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

4.ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව(සිවිල්)

හෝ

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

6. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 06 ) වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**05. තාක්ෂණ සේවයේ (සිවිල්) එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගය**

| **විෂයන්** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| තාක්ෂණික හැකියාව | පැය 03 | 100 | 40% |

**5.1 තාක්ෂණ සේවයේ (සිවිල්) එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට අදාල අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

| අංකය | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 02 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) සමත්ව තිබීම. | විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය,තාක්ෂණවේදය සඳහා විද්‍යාව,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයන් තුනකින් එකවර සමත්වීම | 01.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) ලබා තිබීම.<br>හෝ<br>02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.<br>හෝ<br>03.උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියීක හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

## 06. තාක්ෂණ සේවයේ (සිවිල්) දෙවසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගය

| විෂයන් | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

## 6.1 තාක්ෂණ සේවයේ (සිවිල්) දෙවසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට අදාල අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

| අංකය | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම |
|---|---|---|
| 03 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) සමත්වී තිබීම. | විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය,තාක්ෂණවේදය සඳහා විද්‍යාව,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයන් තුනකින් එකවර සමත්වීම |

## 07. තාක්ෂණ සේවයේ තනතුරු සඳහා වන තරඟ විභාගයේ විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්,ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරිමේ ශක්තියත්,විනිශ්චය කිරිම සඳහා වූ ප්‍රශ්ණ වලින් යුක්තය. |
| තාක්ෂණික හැකියාව | ගොඩනැගිලි,මාර්ග හා වාරිමාර්ග ඉදිකිරීමේ මූලධර්ම ,ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව,ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව,ජල සැපයීම,ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. |

## 08. තාක්ෂණ සේවයට අදාල වැටුප් පරිමාණය

**<u>තාක්ෂණ සේවයේ සිවිල් III ශ්‍රේණියට අදාල වැටුප් පරිමාණය</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 - MN 03 – 2016 අනුව තාක්ෂණ සේවයේ (සිවිල්) III හිමි මාසික වැටුප් පරිමාණය රු. 31,040 – 10 X 445 – 11X 660- 10 X730 - 10 X750 – 57,550 වේ. වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛණ II හි සඳහන් පරිදි වේ.

**<u>තාක්ෂණ සේවයේ (සිවිල්)පුහුණු කිරීමේ ශ්‍රේණියට හිමි දීමනාව.</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛණ V හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ.

ඒ අනුව එක් වසරක පුහුණු ශ්‍රේණිය සඳහා - ( 2019.01.01 දිනට) - රු.24,336/-

දෙවසරක වසරක පුහුණු ශ්‍රේණිය සඳහා - ( 2019.01.01 දිනට) - රු.24,605/-

## 09. අයදුම් කිරීමේ ක්‍රමය

9.1 සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ.මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු 600/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම,බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා බ.ප.1 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය.එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.<u>තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.</u>

9.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **<u>2019.07.28</u>** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත), අංක109 ,මහා විදිය ,බත්තරමුල්ල .** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සිවිල් 111 ශ්‍රේණියට / (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණියට(වසරක) / (සිවිල්)පුහුණු කිරීමේ ශ්‍රේණියට(වසරක) තනතුරට බඳවා ගැනීමේ විභාගය 2019 යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.</u>** මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

9.3 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත්අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 7.1 තෙක් පළමු පිටුවටද අංක 7.2 සිට ඉදිරියට අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන,නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති,අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර, නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැතිබව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.4 අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද,දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

9.5 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්,මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ.සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

9.6 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මඟින් පළ කරනු ඇත.නිවේදනය පළ වී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය.ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද,අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද,අතැතිව ඔබගේ සම්පූර්ණ නම,ලිපිනය,ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

9.7 අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින් ,අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය.දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවාද , අනෙකුත් අයදුම්කරුවන් අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු , සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස් වරයකු නීතීඥයෙකු , ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ,ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු,රු. 498,960/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු,අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**10. විභාගයට ඇතුල්වීම**

10.1 නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, ,එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

10.3 අපේක්ෂකයාගේ අනන්‍යතාවය, තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය.අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රය

**11.සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී,ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්,එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්,ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**12.විභාග ක්‍රමය:**

i. මෙම විභාගය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
ii. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම,තැපැල මඟින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය මඟින් පළකිරීම හෝ සිදු කරනු ඇත.

14.මෙම අයදුම්පත් කැදවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. මෙම ගැසට් නිවේදනය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

16. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

හේමන්ත සමරකෝන්
ලේකම් (වැ.බ.)
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
2019.06.

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සිවිල් III ශ්‍රේණිය, එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණිය, දෙවසරක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2019**

විභාග අංකය [ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරු නාමය [ ]

02. භාෂා මාධ්‍යය
(අදාල කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

03. අ. මුලකුරු සමඟ නම -
ආ. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)
ඇ. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
ඈ. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. 1.ස්ථිර ලිපිනය (සිංහල/දෙමළෙන්) -

11.ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින් )-

111. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

1V. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2019.07.28** දිනට අදාළ බස්නාහිර පළාතේ ස්ථිර පදංචිය -

වර්ෂ- මාස- දින-

V. දුරකථන අංකය -ජංගම [ ] ස්ථාවර [ ]

(සෑම අයදුම්කරුවකු වෙතම තොරතුරු තම ජංගම දුරකථනයට SMS පණිවිඩයක් මඟින් ලබාදෙන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.)

05. 1. උපන් දිනය - වර්ෂය - මාසය - දිනය -

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.07.28 දිනට වයස -

වර්ෂය - මාසය - දිනය -

06. ස්ත්‍රී/පුරුෂ භාවය -(අදාළ කොටුව තුල✓ ලකුණ යොදන්න)

ස්ත්‍රී - [ ] පුරුෂ - [ ]

07. විවාහක/අවිවාහක බව - විවාහක [ ] අවිවාහක [ ]

08. **අධ්‍යාපන සුදුසුකම් -** (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 4.1,5.1, හා 6.1 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාලව පමණක් සුදුසුකම් දැක්විය යුතු අතර සත්‍ය පිටපත් ඇමිණිය යුතුය.)

8.1. නිවේදනය අනුව අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |

8.2 .නිවේදනය අනුව අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම්

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 3 | | |
| 2 | | | 4 | | |

09.**වෘත්තීය සුදුසුකම්** (4.1 හා 5.1 අනුව සඳහන් කළ යුතුවේ)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

10. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

10.1විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................

10.2ලදුපත් අංකය හා දිනය : ..............................................................................................................

10.3 ගෙවූ මුදල : ........................................

ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න

11. ..................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි.තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..........................................

දිනය - අයදුම්කරුගේ අත්සන

## <u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

**(අනවශ්‍ය වචන කපා හරින්න)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන -------------------------------------------- මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්,ඔහු /ඇය ----------------දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම - -------------------------------- අත්සන - -------------------------------------

තනතුර හා නිලමුද්‍රාව ----------------------------------

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයකු , සමාදාන විනිශ්වයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස් වරයකු නීතීඥයෙකු , ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ,ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු, රු. 498,960/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ කෙනෙකු,අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.)